# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2018 පෙබරවාරි මස 02 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2018.02.06 දින නිකුත් කරන ලදී)**


# අධිකරණ සංවිධාන (සංශෝධන)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 23.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත, ඒ පනතේ 12 වන වගන්තියට ඉක්බිතිව ම 12අ, 12ආ සහ 12ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, අලුත් වගන්තිවල නීතිය බලපෑම වනුයේ -

(අ) හයවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සහ එවැනි වරදක් සිදු කිරීමේ ක්‍රියාවලිය තුළ දී කරනු ලබන වෙනත් යම් වරදක් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් විභාග කිරීමට, නඩු විභාග කිරීමට සහ තීරණය කිරීමට විධිවිධාන සැලැස්වීම;

(ආ) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ සංයුතිය නිශ්චිතව දැක්වීම;

(ඇ) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටුවන ස්ථාන හෝ ස්ථානය නිශ්චිතව දැක්වීමට අමාත්‍යවරයාට හැකි කරවීම;

(ඈ) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයාට සහ අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි කරවීම;

(ඉ) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු විභාග සඳහා අදාළ වන වෙනත් ඇතැම් විධිවිධාන සැළැස්වීම;

(ඊ) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩුවක අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් යුත් විනිශ්චය පීඨයක් මගින් විභාග කරනු ලැබීමට විධිවිධාන සැලැස්වීම; සහ

(උ) 12අ අලුත් වගන්තියේ විධිවිධානවලට අනුකූල වන පරිදි වෙනත් නීති කියවා තේරුම් ගැනීමට විධිවිධාන සැලැස්වීම,

වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියට "අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින්, ඒ ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලැබේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයට ඉක්බිතිව ම හයවන උපලේඛනය ඇතුළත් කිරීම මගින් ඒ ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලැබේ.

# අධිකරණ සංවිධාන (සංශෝධන)

එල්. ඩී.—ඕ. 59/2017

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක     දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1978 අංක 2 දරන පනතට 12අ, 12ආ සහ 12ඇ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 12අ, 12ආ සහ 12ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

"ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය.

12අ. (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සහ එවැනි යම් වරදක් සිදු කිරීමේ ක්‍රියාවලිය තුළ දී කරනු ලබන වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව අධිචෝදනා මත පවරනු ලබන සියලු අපරාධ නඩු, (7) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ලිඛිත නීතියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් විභාග කිරීම, නඩු විභාග කිරීම සහ තීරණය කිරීම කළ යුතු ය.

(2) ඒ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් අතුරින් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, එකවර විනිශ්චයාසනාරූඪ වන විනිශ්චයකාරවරයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉන් එක් විනිශ්චයකාරවරයකු, ඒ අධිකරණයේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(3) 9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද—

(අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව ඇතුළත සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ සිදුකරන ලද; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විසින්, ශ්‍රී ලංකාවේ දේශ සීමාවෙන් පිටත කිනම් ස්ථානයක දී වුව ද නැතහොත් කවර වූ හෝ වර්ගයක යම් නැවක හෝ යම් ගුවන් යානයක නැතහොත් එබඳු යම් නැවක් හෝ ගුවන් යානයක් සම්බන්ධයෙන්, සිදු කරන ලද,

(1) වන උපවගන්තියේ සඳහන් කර ඇති වරදක් සම්බන්ධයෙන් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(4) (අ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ පිහිටුවන ස්ථානය හෝ ස්ථාන නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(ආ) අමාත්‍යවරයා විසින් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ පිහිටුවන ස්ථානය හෝ ස්ථාන නිශ්චිතව දැක්වීමේ දී අධිකරණ සේවා කොමිෂන් සභාව විමසනු ලැබිය යුතු ය.

(5) (අ) අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මඟින් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ ඒ අධිකරණ සංඛ්‍යාව වැඩි කරනු ලැබිය හැකි ය.

(ආ) අමාත්‍යවරයා විසින් ඒ අධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමේ දී, අධිකරණ සේවා කොමිෂන් සභාව විමසනු ලැබිය යුතු ය.

(6) (අ) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු මියගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ යම් නඩු විභාගයක් ආරම්භ වීමට පෙර හෝ ආරම්භ වීමෙන් පසුව එම සම්පූර්ණ නඩු විභාගයෙන් ම හෝ එහි කොටසකින් නිදහස් කරන ලෙස ඉල්ලා සිටියහොත් හෝ ක්‍රියා කිරීමට ප්‍රතික්ෂේප කළහොත් නැතහොත් ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් හෝ අන්‍යාකාරයෙන් මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ලෙස කටයුතු කිරීම නතර වන අවස්ථාවක දී, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින්, එකී මරණය, ඉල්ලා අස්වීම, නිදහස් කිරීම, ප්‍රතික්ෂේප කිරීම, නොහැකියාව හෝ එකී විනිශ්චයකාරවරයා මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ලෙස කටයුතු කිරීම නතර වීමට හේතු වන වෙනත් හේතුව ඇති වූ අවස්ථාවේ සිට සති දෙකක් ගතවීමට පෙර ඔහු වෙනුවට එකී සම්පූර්ණ නඩු විභාගය හෝ එහි යම් කොටසක් විභාග කිරීම සඳහා ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ වෙනත් යම් විනිශ්චයකාරවරයකු නම් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ අලුත් විනිශ්චයකාරවරයකු නම් කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ නම් කිරීමට පෙරාතුව ලබා ගත් යම් සාක්ෂියක් නැවත ලබා ගැනීමට අවශ්‍ය නොවිය යුතු අතර ඒ නම් කිරීමට පෙරාතුව ම එම නඩු විභාගය පැවතියේ යම් අවස්ථාවක ද, එම අවස්ථාවේ සිට එම නඩු විභාගය දිගටම පවත්වාගෙන යාමට ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට හිමිකම තිබිය යුතු ය.

(7) අවස්ථාවෝචිත පරිදි, නීතිපතිවරයා හෝ අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තියේ සඳහන්-

(අ) වරදක ස්වභාවය සහ අවස්ථානුගත කරුණු;

(ආ) වරදක බැරෑරුම්කම;

(ඇ) වරදක සංකීර්ණ බව;

(ඈ) වරදක් නිසා වින්දිතයා මත වන බලපෑම; හෝ

(ඉ) වරදක් නිසා රජය මත වන බලපෑම,

සැලකිල්ලට ගෙන, යුක්තිය ඉෂ්ට කිරීම අරහයා සහ මහජන සහ ජාතික යහපත අරහයා, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයෙහි අපරාධ නඩු කටයුතු පවරනු ලැබිය යුතු ය.

(8) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියෙහි ඇති නඩු විභාගයක්-

(අ) නීතිපතිවරයා විසින් හෝ අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන අධිචෝදනා පත්‍රයක් මත පවත්වනු ලැබිය යුතු ය;

(ආ) ඉක්මණින් පවත්වා අවසන් කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) වාර්තා කරනු ලැබිය යුතු අසාමාන්‍ය අවස්ථානුගත කරුණු නිසා අවශ්‍ය වන්නේ නම් මිස, එය ඉක්මණින් අවසන් කිරීමට හැකි වන පරිදි දිනපතා විභාග කළ යුතු ය. යම්කිසි නිශ්චිත දිනයක යම් නිශ්චිත නීතිඥවරයකුට එම දිනයේ දී වෙනත් යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක පෙනී සිටීමට යොදා ගෙන තිබීම ඇතුළුව, යම් හේතුවක් මත ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට නොහැකි වීම, නඩු විභාගය ආරම්භ කරන දිනය කල් දැමීමට හේතුවක් නොවිය යුතු අතර එය නඩු විභාගය කල් දැමීමට අවශ්‍ය

වන අසාමාන්‍ය අවස්ථානුගත කරුණක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(9) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයෙහි නඩු පැවරීමට සහ නඩු විභාගවලට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන සහ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ විධිවිධාන හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

අභියාචනය කිරීමේ අයිතිවාසිකම.

12ආ. (1) 12අ වන වගන්තිය යටතේ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවත්වන ලද නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුවක්, දණ්ඩන නියමයක් හෝ ආඥාවක් සම්බන්ධයෙන් වන අභියාචනයක්, එකී නඩු තීන්දුව, දණ්ඩන නියමය හෝ ආඥාව ප්‍රකාශයට පත් කරන ලද දිනයේ සිට දින විසි අටක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ යුතු අතර අග්‍ර විනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන එකී අධිකරණයේ විනිශ්චයකාරවරයන් පස්දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් යුත් විනිශ්චය පීඨයක් මගින් විභාග කළ යුතු ය. අග්‍ර විනිශ්චයකාරවරයා විසින් එම විනිශ්චය පීඨයට තමාව ම නම් කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) 12අ වන වගන්තිය යටතේ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පවත්වන ලද නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරන ලද, යම් නඩු තීන්දු, දණ්ඩන නියම හෝ ආඥාවලට විරුද්ධව, (1) වන උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන්, ජූරි සභාවක් නොමැතිව විභාග කරනු ලබන නඩුවල දී, මහාධිකරණය විසින් ප්‍රකාශ කරනු ලබන නඩු තීන්දු, දණ්ඩන නියම හෝ ආඥාවලට විරුද්ධව අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු

ලබන අභියාචනවලට අදාළ, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන සහ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ විධිවිධාන හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ කරන ලද යම් අභියාචනයක්, ඉක්මනින් විභාග කර අවසන් කළ යුතු ය.

ස්ථිර විශේෂ මහාධිකරණයේ නඩු පවරනු ලබන වැරදිවලට අදාළව ලිඛිත නීති කියවා තේරුම් ගැනීම.

12ඇ. 12අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් වරදක් සම්බන්ධයෙන්, 12අ වන වගන්තියේ (8) වන උපවගන්තිය ප්‍රකාරව ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු පවරනු ලැබ ඇති අවස්ථාවක දී, අදාළ නීතියේ වෙනත් අධිකරණයකට කර ඇති සඳහන් කිරීමක්, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ අධිචෝදනාව ගොනුකරන ලද දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට කරන ලද සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "දිසා අධිකරණ" සහ "මහෙස්ත්‍රාත් අධිකරණ" යන යෙදුම්වල අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''"අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරන ලද අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;".

ප්‍රධාන ප්‍රඥප්තියට හයවන උපලේඛනය එකතු කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය එකතු කිරීම මගින් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"හය වන උපලේඛනය

[12අ (1) වන වගන්තිය]

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| නීතිය | වගන්තිය සහ වරද |
| දණ්ඩ නීති සංග්‍රහය (19 වන අධිකාරය) | 366 - සොරකම. |
| | 386 - දේපළ වංක ලෙස ව්‍යපහරණය කිරීම. |
| | 387 - යම් තැනැත්තකුගේ මරණය සිදුවන වේලෙහි ඔහු සන්තකයෙහි තිබූ දේපළ වංක ලෙස ව්‍යාපහරණය කිරීම. |
| | 388 - සාපරාධී විශ්වාස භාරය කඩ කිරීම. |
| | 390 - වාහකයකු ආදීන් විසින් සාපරාධී විශ්වාස භාරය කඩ කිරීම. |
| | 391 - ලිපිකරුවකු හෝ සේවකයකු විසින් සාපරාධී විශ්වාස භාරය කඩ කිරීම. |
| | 392 - රජයේ සේවකයකු විසින් හෝ බැංකුකරුවකු, වෙළෙන්දකු හෝ නියෝජිතයකු විසින් කරනු ලබන සාපරාධී විශ්වාස භාරය කඩ කිරීම. |
| | 392අ - මුදලක් හෝ මුදල් ශේෂයක් හෝ සම්බන්ධයෙන් රජයේ සේවකයකු විසින් සාපරාධී විශ්වාස භාරය කඩ කිරීම. |
| | 392ආ - නියෝජිතයකු විසින් තැපැල් භාණ්ඩ සම්බන්ධයෙන් සාපරාධී විශ්වාස භාරය කඩ කිරීම. |
| | 394 - සොරකම් කරන ලද දේපළ වංක ලෙස භාරගැනීම. |
| | 395 - සොරකම් කරන ලද දේපළ ඇබ්බැහියෙන් ගනුදෙනු කිරීම. |
| | 396 - සොරකම් කරන ලද දේපළ සඟවා තැබීමට සහාය වීම. |
| | 398 - වංචා කිරීම. |

| | |
|---|---|
| | 399 - අන්‍යයකුගේ නාමයෙන් පෙනී සිට වංචා කිරීම. |
| | 401 - යම් තැනැත්තකුගේ අර්ථලාභය ආරක්ෂා කිරීමට වරදකරු බැඳී සිටී ද ඒ තැනැත්තාට අයුතු අපාර්ජණයක් සිදුවිය හැකි බව දැන දැනම වංචා කිරීම. |
| | 403 - වංචා කිරීම සහ යම් දේපළක් භාරදීමට වංක ලෙස පෙළඹවීම. |
| | 404 - ණය හිමියන් අතර බෙදා හැරීම වැළැක්වීම සඳහා වංක ලෙස හෝ වංචනික ලෙස දේපළ ඉවත් කිරීම හෝ සැඟවීම. |
| | 405 - වරදකරුට ලැබිය යුතු ණයක් හෝ ඉල්ලීමක් ඔහුගේ ණයකරුවන්ට ලබා ගැනීම වංක ලෙස හෝ වංචනික ලෙස වැළැක්වීම. |
| | 406 - ප්‍රතිෂ්ඨාව පිළිබඳ අසත්‍යය ප්‍රකාශයක් ඇතුළත් පැවරුම් ඔප්පුවක් වංක ලෙස හෝ වංචනික ලෙස ලියා අත්සන් කිරීම. |
| | 407 - වංක ලෙස හෝ වංචනික ලෙස දේපළ ඉවත් කිරීම හෝ සැඟවීම හෝ හිමිකම් පෑමකින් නිදහස් කිරීම. |
| | 452 - කූට ලේඛන සෑදීම. |
| | 453 - අසත්‍ය ලේඛනයක් සෑදීම. |
| | 455 - අධිකරණයක වාර්තාවක් හෝ ආණ්ඩුවේ උප්පැන්න නාම ලේඛනයක් ආදිය කූට ලෙස සෑදීම. |
| | 456 - අගනා සුරැකුම්පතක් හෝ අන්තිම කැමති පත්‍රයක් කූට ලෙස සෑදීම. |
| | 457 - රැවටීමේ කාර්ය සඳහා කූට ලේඛන සෑදීම. |
| | 459 - කූට ලෙස සාදනු ලැබූ ලේඛනයක් නිර්ව්‍යාජ ලේඛනයක් ලෙස පාවිච්චි කිරීම. |
| | 460 - 456 වන වගන්තිය යටතේ දඬුවම් කළ හැකි කූට ලේඛන සෑදීමේ වරදක් කිරීමේ චේතනාවෙන්, ව්‍යාජ ලෙස අනුකරණය කරන ලද මුද්‍රාවක්, තහඩුවක් යනාදිය සෑදීම හෝ සන්තකයේ තබා ගැනීම |

| | | |
|---|---|---|
| | 461 | - අන්‍යාකාරයකින් දඬුවම් කළ හැකි, කූට ලේඛන සෑදීමේ වරදක් සිදු කිරීමේ චේතනාවෙන්, ව්‍යාජ ලෙස අනුකරණය කරන ලද මුද්‍රාවක්, තහඩුවක් යනාදිය සෑදීම හෝ සන්තකයේ තබා ගැනීම. |
| | 462 | - කූට ලෙස සාදනු ලැබූ බව දන්නා වාර්තාවක් හෝ අගනා සුරැකුම්පතක් හෝ අන්තිම කැමති පත්‍රයක් නිර්ව්‍යාජ ලේඛනයක් ලෙස පාවිච්චි කිරීමේ චේතනාවෙන් එය තම සන්තකයෙහි තබා ගැනීම. |
| | 463 | - 456 වන වගන්තියෙහි විස්තර කර ඇති ලේඛනවල සත්‍ය බව සහතික කිරීම සඳහා පාවිච්චි කරනු ලබන උපක්‍රමයක හෝ සලකුණක ව්‍යාජ අනුකරණයක් සෑදීම හෝ ව්‍යාජ අනුකරණයකින් සලකුණු කරන ලද ද්‍රව්‍ය සන්තකයෙහි තබාගැනීම. |
| | 464 | - 456 වන වගන්තියෙහි විස්තර කර ඇති ලේඛන නොවන ලේඛනවල සත්‍ය බව සහතික කිරීම සඳහා පාවිච්චි කරනු ලබන උපක්‍රමයක හෝ සලකුණක ව්‍යාජ අනුකරණයක් සෑදීම හෝ ව්‍යාජ අනුකරණයකින් සලකුණු කරන ලද ද්‍රව්‍ය සන්තකකයෙහි තබා ගැනීම. |
| | 467 | - ගිණුම් වරදවා දැක්වීම. |
| | 468 | - යම් මුදල් නෝට්ටුවක, බැංකු නෝට්ටුවක හෝ කාසියක යම් අනුකරණයක් තම සන්තකයෙහි තබා ගැනීම. |
| | 101, 101අ, 102, 113අ, 113ආ | - මේ උපලේඛනයේ දක්වා ඇති දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන වැරදි කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම සහ අනුබල දීම. |
| 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත | 3 | - මුදල් විශුද්ධිකරණ වරද. |
| | 4 | - මේ වගන්තිය යටතේ වරදක් වන ක්‍රියාවක්. |
| | | - මේ උපලේඛනයේ දක්වා ඇති 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ වන වැරදි කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම සහ අනුබල දීම. |

| | | |
|---|---|---|
| අල්ලස් පනත (26 වන අධිකාරය) | 14 | - අධිකරණ නිලධරයන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සම්බන්ධයෙන් වූ අල්ලස්. |
| | 15 | - රජයේ සේවකයන් සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් කුටු පඬුරු භාර ගැනීම. |
| | 16 | - පොලිස් නිලධරයන්, සාම නිලධරයන් සහ වෙනත් රජයේ සේවකයන් සම්බන්ධයෙන් වූ අල්ලස්. |
| | 17 | - ගිවිසුම් සම්බන්ධයෙන් සහාය ලබා දීම හෝ බලපෑම් කිරීම සඳහා වන අල්ලස්. |
| | 18 | - ටෙන්ඩර් පත්‍ර අස්කරවා ගැනීම පිණිස වූ අල්ලස්. |
| | 19 | - ආණ්ඩුවේ කටයුතු සම්බන්ධයෙන් වූ අල්ලස්. |
| | 20 | - ඉල්ලීම්, ගෙවීම්, පත්කිරීම්, සේවයෙහි යෙදවීම්, ප්‍රදාන, බදු දීම් සහ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් වූ අල්ලස්. |
| | 21 | - ආණ්ඩුව සමඟ ගනුදෙනු ඇති තැනැත්තන් විසින් රජයේ සේවකයන්ට දෙන අල්ලස්. |
| | 22 | - පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකු සඳහා වූ අල්ලස් සහ පළාත් පාලන ආයතනයක හෝ එබඳු ආයතනයක නිලධරයකු හෝ සේවකයකු සඳහා වූ අල්ලස්. |
| | 23 | - පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකුගේ ඡන්දය කෙරෙහි බලපෑම පිණිස තර්ජනය කිරීම හෝ වංචා කිරීම. |
| | 23 අ | - අල්ලස් මගින් අත්කරගත් දේපළ හෝ අල්ලස් මගින් අත්කරගත් දේපළ පරිවර්තනය කර ඇති හෝ කර තිබූ දේපළ ලෙස මේ වගන්තිය යටතේ සැලකෙන දේපළ අයත්ව සිටීම හෝ අයත්ව සිටි බව. |

| | |
|---|---|
| | 24 - තුටු පඬුරක් භාරගැනීම.<br>25 - අල්ලස් පනතේ II වනකොටස යටතේ වූ වරදක් කිරීමට තැත් කිරීම හා අනුබල දීම.<br>70 - දූෂණය.<br>- මේ උපලේඛනයේ දක්වා ඇති අල්ලස් පනත යටතේ වන වැරදි කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම සහ අනුබල දීම. |
| 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත | 3 - පොදු දේපළ සොරකම් කිරීම.<br>5 - වංක ව්‍යාපහරණය, සාපරාධ විශ්වාස කඩ කිරීම, වංචා කිරීම, ව්‍යාජ ලේඛන සෑදීම සහ ගිණුම් වරදවා පෙන්වීම.<br>- මේ උපලේඛනයේ දක්වා ඇති පොදු දේපළ විෂයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත යටතේ වන වැරදි කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම සහ අනුබල දීම. |
| 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත | 3 - 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වන වැරදි<br>- මේ උපලේඛනයේ දක්වා ඇති ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වන වැරදි කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම සහ අනුබල දීම. |
| 1988 අංක 30 දරන බැංකු පනත | බැංකු පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |
| 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | විදේශ විනිමය පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |
| (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත | ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |

| | |
|---|---|
| (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත | දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |
| 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |
| 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත | රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |
| 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත | මුදල් ව්‍යාපාර පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |
| 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත | ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |
| 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත | පරිගණක අපරාධ පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක්. |
| අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධව තත්කාලීනව බලපවත්නා යම් නීතියක් යටතේ වන වැරදි. | |
| අවුරුදු පහක් හෝ ඊට වැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි තත්කාලීනව බලපවත්නා යම් නීතියක් යටතේ වන වරදක්.”. | |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.